00239

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2021/2022
අවසාන පරීක්ෂණය - (1 වන අදියර) 2023
**STP8212/STP8312/ESP2112 - බහු ශ්‍රේණි ඉගැන්වීම**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.10 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද II වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. බහුශ්‍රේණි ඉගැන්වීමේ දැකිය හැකි ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

02. බහුශ්‍රේණි ඉගැන්වීම අපට අවශ්‍ය වන්නේ ඇයි ද යන්නට හේතු පහක් (05) දෙන්න.

03. කිරියාකෝ (Kyriakou – 1997) දක්වන පරිදි ඉගෙනුමක් ඇති වීමට අත්‍යවශ්‍ය වන මනෝවිද්‍යාත්මක තත්ත්වයන් තුන (03) සඳහන් කරන්න.

04. 'පන්තිකාමර කළමනාකරණය' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

05. විෂය විසුරුම (Subject staggering) යන පදයේ අර්ථය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ශිෂ්‍යයාගේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ඉගෙනුම් ඵල පිළිබඳ ඔබට මනා අවබෝධයක් තිබිය යුතු ය. ඉගෙනුම් ඵලයක් යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න.

07. බහුශ්‍රේණි පන්ති කාමරයක භාවිත කළ හැකි තක්සේරු ක්‍රමයක් ලෙස 'ශිෂ්‍ය කාර්ය සාධන ගොනු' කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ඔබ ප්‍රධාන විෂයමාලා තේමා හඳුනා ගැනීමේ දී අනුගමනය කළයුතු පියවර තුන (03) සඳහන් කර ඉන් පළමු පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 x 08 = 40)

## II වන කොටස

09. (i) බහුශ්‍රේණි ගුරුවරයකුට අවශ්‍ය සුවිශේෂී කුසලතා හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) බහුශ්‍රේණි පන්ති කාමරයක ඉගෙනුම ලබන සිසුන්ට අත්වන වාසි තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) බහුශ්‍රේණි පන්ති කාමර මට්ටමින් ගුරුවරුන් මුහුණ දෙන අභියෝග හතරක් (04) හඳුනාගෙන එම අභියෝග ජය ගැනීම සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. (i) චර්යාවාදී ආකෘති හා ප්‍රජානන ආකෘති අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

(ii) සංවිධානාත්මක දැනුම, අසම්බන්ධිත දැනුමට වඩා හොඳ වන්නේ ඇයි? (ලකුණු 06)

(iii) යෝග්‍ය ඉගෙනුමක් සිදුවීමට ගුරුවරයෙකුට කළ හැකි දෑ (අවම වශයෙන් හතරක්) මොනවා ද? (ලකුණු 10)

11. (i) ධනාත්මක ඉගෙනුම් පරිසරයක ලක්ෂණ හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) සිසුන්ගේ අයහපත් චර්යා (misbehavior) සඳහා බලපාන හේතු තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සිසුන්ගේ අයහපත් චර්යා පාලනය කිරීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට කළ හැක්කේ කුමක් ද? (ලකුණු 10)

12. (i) බහුශ්‍රේණි පන්තියක භාවිත කළ හැකි ප්‍රාදේශීය සම්පත් හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) මුද්‍රිත සම්පත් දෙකක් **(02)** නම් කර එම සම්පත් බහු ශ්‍රේණි පන්ති කාමරයක ඵලදායී අයුරින් භාවිත කළ හැක්කේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉලෙක්ට්‍රොනික සම්පත් දෙකක් **(02)** නම් කර ඒවා බහුශ්‍රේණි පන්ති කාමරයක භාවිත කිරීමේ දී මතුවිය හැකි අභියෝග හඳුනා ගන්න. ඉහත සඳහන් කළ අභියෝග ජය ගැනීම සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

13. (i) 'සම්භවන තක්සේරුකරණය' (Formative Assessments) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) 'සම්පිණ්ඩිත තක්සේරුකරණය' (Summative assessment) යනු කුමක්දැයි දක්වන්න. එය බහුශ්‍රේණි පන්ති කාමරයක වඩා ඵලදායීව ඔබට භාවිත කළ හැක්කේ කෙසේ ද? (ලකුණු 06)

(iii) ඔබ දකිනා ආකාරයට තක්සේරුකරණය හා ඇගයීම (Evaluation) ගුරුවරයෙකු ලෙස ඔබටත් ඔබගේ සිසුන්ටත් වැදගත් වන්නේ කෙසේ ද? (ලකුණු 10)

14. i. විෂයමාලා සංවර්ධනයේ දී භාවිත කරනු ලබන ප්‍රධාන ප්‍රවේශ තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 04)

ii. විෂය පාදක විෂයමාලාව යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. ඔබගේ පාසල් සංදර්භයෙන් ලබාගත් උදාහරණ දෙකක් **(02)** ඇසුරින් සර්පිලාකාර එලඹුම යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.